# HDFC BANK

දශක හතරක කාලයක් පුරා විවිධ මූල්‍ය විසඳුම් හරහා සුවහසක් ශ්‍රී ලාංකිකයන්ගේ  හිසට සෙවණක් මෙන්ම ව්‍යාපාරික ප්‍රජාවට මූල්‍ය සහාය සපයමින් දැයේ අභිවෘද්ධිය උදෙසා කැප වන බැංකුවක් සමඟ ඔබේ බැංකුකරණ වෘත්තීය උසස් තලයකට ගෙන ඒමට මහඟු අවස්ථාවක් උදා වී ඇත.

**HDFC** බැංකුවෙහි පහත සදහන් තනතුරු සඳහා දක්ෂ, ක්‍රියාශීලි සහ සුබවාදී දැක්මක් සහිත අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## තොරතුරු ආරක්ෂණ තර්ජන විශ්ලේෂක

**වගකීම්**

- ආරක්ෂක විශ්ලේෂණ මෙවලම් භාවිතයෙන් තර්ජන සහ අවදානම් වාර්තා සකස් කිරීම.
- ආයතනික තොරතුරු වත්කම්වල ආරක්ෂක පාලන දැඩි කිරීම සහ සමාලෝචනය කිරීම.
- අවදානම්සහගත තත්ත්වයන් වාර්තා කිරීම හා විසඳුම් යෝජනා කිරීම සහ අඛණ්ඩ ආරක්ෂක ගැටලු හැසිරවීම.
- කාලානුරූපීව මාර්ගගත ආරක්ෂණ හැකියා වර්ධනය කිරීමට සහාය වීම.
- වාර්ෂික අවදානම් සහ පරීක්ෂණ අවශ්‍යතා සඳහා සහාය වීම.
- විවිධ කර්මාන්ත හා විශේෂිත කණ්ඩායම් වෙතින් එල්ල විය හැකි සයිබර් තර්ජන පිළිබඳ බුද්ධි තොරතුරු සම්බන්ධයෙන් අවශ්‍ය පූර්ව ආරක්ෂක ක්‍රියා මාර්ග ගැනීම.
- බැංකු තොරතුරු පද්ධතිවල ආරක්ෂාව සහතික කිරීම, තොරතුරුවල ආරක්ෂාව සම්බන්ධ සිදුවීම්වලට ක්ෂණිකව ප්‍රතිචාර දැක්වීම හා ස්වයංක්‍රීය ක්‍රම හරහා එල්ල විය හැකි ආරක්‍ෂක තර්ජන හඳුනා ගැනීමට, පාලනය කිරීමට හා වැළැක්වීමට සහාය වීම.

**සුදුසුකම්**

- තොරතුරු ආරක්ෂාව හෝ සයිබර් ආරක්ෂාව පිළිබඳ පිළිගත් විශ්ව විද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම.
- Certified Ethical Hacker වැනි අදාළ ආරක්ෂක වෘත්තීය සුදුසුකම් ලබා තිබීම අමතර සුදුසුකමක් වනු ඇත.
- සමාන තනතුරක වසර 5ක සේවා පළපුරුද්දක් තිබීම.
- අවදානම් කළමනාකරණය සහ ආරක්ෂක මෙවලම් පිළිබඳ දැනුම තිබීම.
- විශිෂ්ට විශ්ලේෂණ සහ දෝෂ නිරාකරණ කුසලතා පැවතීම.

**වයස් සීමාව**

- වයස අවුරුදු 45ට අඩු වීම වඩාත් සුදුසු වේ.

තෝරා ගන්නා ලද අපේක්ෂකයින් III (2) ශ්‍රේණියෙහි පිහිටුවන අතර, ආකර්ෂණීය වැටුප් සහ දීමනා හිමි වේ.

## විධායක නිලධාරී - පාලන අවදානම් සහ අනුකූලතා (තොරතුරු ආරක්ෂණ)

**වගකීම්**

- අදාළ නියාමනවලට අනුකූල වන ආකාරයේ තොරතුරු ආරක්ෂණ ප්‍රතිපත්ති හා ක්‍රියා පටිපාටි සැකසීම, ක්‍රියාත්මක කිරීම හා සමාලෝචනය කිරීම සඳහා සහාය වීම.
- ආරක්ෂණ ප්‍රතිපත්ති කාලානුරූපීව ක්‍රියාත්මක කිරීමට සහ පවත්වා ගෙන යාමට සහාය වීම.
- ආරක්ෂණ ප්‍රතිපත්තිවලට අදාළ පාලන ලිපිගොනු සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම සහ පරිශීලකයන් ඒවා පිළිපදින බව සහතික කිරීම.
- තොරතුරු ආරක්ෂණය පිළිබඳ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අනෙකුත් දෙපාර්තමේන්තු සමඟ සමීපව කටයුතු කිරීම.
- ආරක්ෂාව පිළිබඳ යහපත් සංස්කෘතියක් ගොඩනැගීම සඳහා ඉවහල් වන දැනුවත් කිරීම්වලට සහ පුහුණු වැඩසටහන්වලට සහාය වීම.

- HDFC බැංකුවේ අනුකූලතා හා තොරතුරු තාක්ෂණ අවශ්‍යතාවලට සහාය විය යුතු අතර නියාමන හා බැංකුවේ අවශ්‍යතාවල අනුකූලතා සාක්ෂාත් කර ගනිමින් තොරතුරු ආරක්ෂණ කාර්යයට සහාය විය යුතුය.

**සුදුසුකම්**

- තොරතුරු ආරක්ෂණය හෝ කළමනාකරණ තොරතුරු පද්ධති පිළිබඳව පිළිගත් විශ්ව විද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම.
- සමාන තනතුරක අවම වශයෙන් වසර 3ක පළපුරුද්දක් ලබා තිබීම.
- මූල්‍ය ක්ෂේත්‍රයට අදාළ නියාමන සහ කර්මාන්ත මග පෙන්වීම් පිළිබඳව කාලීන දැනුම තිබීම.
- ඉංග්‍රීසි භාෂාව පිළිබඳ කුසලතාව, ලිවීම හා සන්නිවේදනය.

**වයස් සීමාව**

- වයස අවුරුදු 45ට අඩු වීම වඩාත් සුදුසු වේ.

තෝරා ගන්නා ලද අපේක්ෂකයින් III (3) ශ්‍රේණියෙහි පිහිටුවන අතර, ආකර්ෂණීය වැටුප් සහ දීමනා හිමි වේ.

## මෘදුකාංග ඉන්ජිනේරු

**වගකීම්**

- පරිශීලක අවශ්‍යතා විශ්ලේෂණය කිරීම.
- කේත ලිවීම හා පරීක්ෂා කිරීම, අවශ්‍ය පරිදි ඒවා ප්‍රසාදනය කිරීම හා නැවත ලිවීම සහ ව්‍යාපෘතියට සම්බන්ධ ඕනෑම ක්‍රමලේඛකයෙකු සමඟ සන්නිවේදනය කිරීම.
- නව මෘදුකාංග වැඩසටහන් හා පරිගණක මෙහෙයුම් පද්ධති පරීක්ෂා කිරීම, නිර්මාණය කිරීම සහ රචනා කිරීම.
- පරිගණක හා දෘඩාංග ක්‍රියාත්මක කරන මෘදුකාංග හා පද්ධති ඇගයීම.
- නවීකරණය විය යුතු ක්ෂේත්‍ර විශ්ලේෂණය කරමින් සහ හඳුනා ගනිමින් දැනට පවතින වැඩසටහන් සංවර්ධනය කිරීම.
- පවතින මෘදුකාංග නිෂ්පාදන ඒකාබද්ධ කිරීම සහ එකිනෙකට වෙනස් වේදිකා ඒකාබද්ධ ලෙස ක්‍රියා කිරීමට කටයුතු සැළසීම.
- තාක්ෂණික පිරිවිතර නිර්මාණය කිරීම.
- තාක්ෂණික රචකයන් සමඟ මෙහෙයුම් ලිපිගොනු රචනා කිරීම.
- මෘදුකාංග දෝෂ නිරීක්ෂණය සහ නිවැරදි කිරීම මඟින් පද්ධති පවත්වා ගෙන යාම.
- දැනට පවතින මෙහෙයුම් පද්ධති රචනා කිරීම හෝ නවීකරණය කිරීමේ අරමුණින් මෘදුකාංග පද්ධතිවල නඩත්තුව හා ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් සේවාදායකයන් හා කාර්ය මණ්ඩලය සමඟ සාකච්ඡා කිරීම.
- නව තාක්ෂණය පිළිබඳව සොයා බැලීම.
- ඉංජිනේරු මූලධර්ම හා ක්‍රම ලේඛණ භාෂා දැනුම යොදමින් HDFC බැංකුව සඳහා මෘදුකාංග විසඳුම් ගොඩනැගීම හා පරිගණක මෘදුකාංග යෙදුම් සැළසුම් කිරීම, සංවර්ධනය කිරීම, නඩත්තු කිරීම, පරීක්ෂා කිරීම හා ඇගයීම.

**සුදුසුකම්**

- පරිගණක වැඩසටහන්කරණය පිළිබඳ වසර දෙකක පළපුරුද්ද සමඟ පිළිගත් විශ්ව විද්‍යාලයකින් පරිගණක විද්‍යාව පිළිබඳ උපාධියක් ලබා තිබීම.
  හෝ
- පරිගණක වැඩසටහන්කරණය පිළිබඳ වසර තුනක පළපුරුද්ද සමඟ පිළිගත් ඩිප්ලෝමාවක් ලබා තිබීම. (අවම වශයෙන් වසරක කාල සීමාවක් සහිත ඩිප්ලෝමාවක් විය යුතුය.)
- Java, dotNet, mobile application, C# සහ Oracle SQL භාවිතා කරමින් බැංකුවක හෝ මූල්‍ය ආයතනයක මෘදුකාංග සංවර්ධනයට දායක වී තිබීම අමතර සුදුසුකමක් වනු ඇත.

**වයස් සීමාව**

- වයස අවුරුදු 45ට අඩු වීම වඩාත් සුදුසු වේ.

තෝරා ගන්නා ලද අපේක්ෂකයින් IV ශ්‍රේණියෙහි පිහිටුවන අතර, ආකර්ෂණීය වැටුප් සහ දීමනා හිමි වේ.

**අයදුම් කිරීමේ ක්‍රමවේදය**

විද්‍යුත් පණිවිඩයේ විෂය තීරයෙහි (**Subject**) ඉල්ලුම් කරන තනතුර සඳහන් කරමින් 13.03.2024 දින හෝ එදිනට පෙර තමා පිළිබඳ විස්තර ලබා ගත හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුද සඳහන් කරමින් ඔබගේ ඉල්ලුම් පත්‍රය careers@hdfc.lk යන විද්‍යුත් ලිපිනය වෙත යොමු කළ යුතුය.

අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය වන විට ඉල්ලා ඇති සුදුසුකම් සහ පළපුරුද්ද සපුරා නොමැති පුද්ගලයන්ට මෙම තනතුර සඳහා අයදුම් කළ නොහැක. අදාළ සුදුසුකම් සපුරා නොමැති පුද්ගලයන්ගේ අයදුම්පත් සහ අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව ලැබුණු අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරෙනු ඇත.

සම්මුඛ පරීක්ෂණයේදී අදාළ ලිපි ගොනුවල මුල් පිටපත් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අයදුම්කරුවන් කිසිදු හේතුවක් මත මෙම තනතුර සඳහා පත් නොකෙරෙනු ඇත.

ඕනෑම ආකාරයක බලපෑම් කිරීමක් මෙම තනතුර සඳහා නුසුදුසුකමක් ලෙස සැළැකේ.

බඳවා ගැනීම් කල් දැමීමට හෝ අවලංගු කිරීමට HDFC බැංකුවට හැකියාවක් ඇත. තෝරා ගත් අයදුම්කරුවන් පමණක් බඳවා ගැනීමේ ක්‍රමවේදයේ ඉදිරි අදියර සඳහා කැඳවනු ඇත.

**සහකාර සාමාන්‍යාධිකාරී - මානව සම්පත් හා පාලන**
**HDFC බැංකුව**
**තැ. පෙ. 2085**
**ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාර්ඩිනර් මාවත**
**කොළඹ 02**
**දුරකථන අංකය: 0112356800 වෙබ් අඩවිය: www.hdfc.lk**